**ශීර්ෂය124 - සමාජ සේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයෙහි හා 2 ඡේදයෙහි අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| **216** | **සමාජ සේවා දෙපාර්තමේන්තුව** |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් සමාජ සේවා අමාත්‍යාංශයේ හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරිට හා ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කර ඇත. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂය** | **අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 2015.08.07 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 2015.08.07 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. ගිණුම්

-------

**2.1 විසර්ජන ගිණුම්**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,503 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,418 ක් උපයෝජනය කර තිබුණි. **ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 57 ක් හා රු.මිලියන 28 ක් වී තිබුණි. එය සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 1.4 ක් හා සියයට 6.1 ක ප්‍රමාණයක් වී තිබුණි.** විස්තර පහත දැක්වේ.

| **ශීර්ෂය** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 124 | 4,048 | 3,991 | 57 | 1.4 |
| 216 | 455 | 427 | 28 | 6.1 |
| **එකතුව** | **4,503** | **4,418** | **85** | **1.9** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

## 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12401 | 7.0 | 6.4 | 3.5 | 7.3 | 45.0 | 19.0 |
| 21601 | 15.0 | 12.1 | 11.2 | 13.3 | 80.0 | 51.0 |

## 2.3 අග්‍රිම ගිණුම්

සමාජ සේවා අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 0.2 ක් වී තිබුණි.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 7.6 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| සමාජ සේවා අමාත්‍යාංශය | 6000/0000/000/0015/0037/000 | 6.7 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0097/000 | 0.9 |
| එකතුව | | 7.6 |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සමාජ සේවා අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන සමාජ සේවා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂය 124 - සමාජ සේවා අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (ආ) | දුරකථන ඇමතුම් ලේඛනය | මුදල් රෙගුලාසි 850 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඈ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ ) | යාවත්කාලින කර නොතිබුණි. |

3.2 **විගණන සාක්ෂි නොවීම**

**-------------------------**

නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ පහත සඳහන් ගනුදෙනු සනාථ කිරිම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොවිම නිසා ඒවා සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

(අ) මැලේසියාවේ බෞද්ධ සංගමයක් විසින් සමාජ සේවා අමාත්‍යවරයා වෙත පරිත්‍යාග කරන ලද රෝද පුටු, කිහිලිකරු හා ඇවිදිමේ උපකරණ තොගය සඳහා නිශ්කාෂණ ගාස්තු ලෙස රු.264,901 ක් ගෙවා තිබුණද එම භාණ්ඩ බෙදා හැරීමේ විස්තර හා බෙදාහැරි මේ කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකළ බව තහවුරු කිරිමට ප්‍රමාණවත් තොරතුරු,

(ආ) ඇමෙරිකා එක්සත් ජනපදයේ ආයතනයක් විසින් සිංහ සමාජයේ නිලධාරියෙකු වෙත එවා තිබු කිරිපිටි තොගය සඳහා නිශ්කාෂණ ගාස්තු ලෙස රු.135,229 ක් ගෙවා තිබුණද එම භාණ්ඩ අමාත්‍යාංශයට පවරාදුන් බවට හෝ බෙදාදුන් ආකාරය පිළිබඳ තොරතුරු,

(ඇ) ආයතන හතරක් වෙත තීරුබදු සහන නිර්දේශ කිරිමේදී, අදාල ආයතන සමඟ එළඹ තිබුණු ගිවිසුම්,

(ඇ) ආයතන 02 ක් සඳහා තීරුබදු සහන ලබාදීමේදී රු.4,689,220 ක් වටිනා භාණ්ඩ බෙදාහැරීම සමාජ සේවා අමාත්‍යාංශයේ සුපරික්ෂණය යටතේ සිදුකළ යුතු බව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණද, භාණ්ඩ බෙදාහැරිම සමාජ සේවා අමාත්‍යාංශයේ සුපරික්ෂණය යටතේ සිදුකළ බව තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි,

(ඉ) හිටපු ජනාධිපතිතුමාගේ කථා ඇතුළත් නායකත්වයේ සිරස්තල පොත මුද්‍රණය කිරිම සඳහා රජයේ පුවත්පත් ආයතනයක් වෙත 2014 පෙබරවාරි 26 දින රු.100,000 ක් ගෙවා තිබුණද, අදාළ පොත් මුද්‍රණයෙන් පසුව භාරගත් බවට හෝ පොත් ලැබු බවට තොග ලේඛනවල සටහන්,

(ඊ) 2001 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සිසුනැණ මධ්‍යස්ථාන 115 ක් ආරම්භ කර තිබුණු අතර 2014 වර්ෂයේදී මධ්‍යස්ථාන 22 ක් ආරම්භ කර තිබිණි. 2014 වර්ෂයේදි මධ්‍යස්ථාන 40 ක් අධික්ෂණය කිරිමට සැලැසුම් කර තිබුණු අතර මධ්‍යස්ථාන 20 ක අධික්ෂණ කටයුතු සිදු කළ බව සඳහන් කර තිබුණි. මේ සඳහා ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රතිපාදන සළසා නොතිබුණ අතර අදාල මධ්‍යස්ථාන 20 ක අධික්ෂණ කටයුතු කළ බව තහවුරු කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි,

(උ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල උපදේශන වැඩසටහන් 378 ක් පැවැත්වීමට ප්‍රතිපාදන සළසා තිබුණද, එම උපදේශන වැඩසටහන් පැවැත් වූ බව සනාථ කිරිමට කාර්යාල 57 ක් විසින් ඉදිරිපත් කළ යුතු ප්‍රගති වාර්තා ,

(ඌ) පැය 24 පුරා ජංගම දුරකථන මඟින් පුද්ගලයින් 48,000 කට උපදේශන සේවාවන් සැපයීම අරමුණු කරගෙන ඒ සඳහා රු.360,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදි පුද්ගලයින් 46,316 කට සේවා සපයා තිබුණු බව ප්‍රගති වාර්තාවල සඳහන්ව තිබුණද, ඒවා තහවුරු කිරීමේ ලිඛිත සාක්ෂි,

(එ) දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් බෙදාහැර ඇති බව සඳහන් රු.1,235,000 ක් වටිනා රෝද පුටු 160 ක් ලබා ගත් පුද්ගලයන් පිළිබඳ තොරතුරු,

(ඒ) විවිධ ස්ථානවල පවත්වන ලද බවට තොරතුරු ඉදිරිපත් කර තිබුණු ජංගම සේවා සඳහා ලබාදී ඇති බව සඳහන් රු.1,610,290 ක් වටිනා රෝද පුටු 132 ක් බෙදා හැරීම පිළිබඳ විස්තර.

(ඔ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත රු.225,550 ක් වටිනා ඇස් කණ්ණාඩි 347 ක් යවා තිබුණද, එම ඇස් කණ්නාඩි අදාල ප්‍රතිලාභීන් වෙත භාර දුන් බව තහවුරු කිරීමේ සාක්ෂි,

(ඕ) 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී අමාත්‍යාංශය විසින් මිලදීගත් ජංගම දුරකථන පිළිබඳ තොරතුරු,

(ක) ස්වේච්ඡා සංවිධාන 05 ක් සඳහා තීරුබදු සහන ඉල්ලුම් කිරිමේදි භාණ්ඩ බෙදාහැරීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතේ සිදු කළ යුතු බවට සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම්/අතිරේක සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලේකම් (පාලන) විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා තිබුණි. එසේ බෙදාහැරීම සම්බන්ධව අධීක්ෂණයක් සිදුකළ බව තහවුරු කිරිමට අවශ්‍ය සාක්ෂි,

(ග) අසරණ සරණ සමිතියකට කෘත්‍රිම පාද නිෂ්පාදනයට අවශ්‍ය රු.907,951 ක් වටිනා අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා තීරුබදු සහන ලබාගෙන තිබුණද, එම සේවා අයිතම බෙදාහැරිමේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සුපරික්ෂණය යටතේ සිදුකළ බවට සාක්ෂි,

## 3.3 විසර්ජන ගිණුම

--------------------

### 3.3.1 අයවැය විචලනය

--------------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.21,416,302 ක් හෙවත් සියයට 10 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 3.3.2 වර්ගීකරණ දෝෂ

--------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය සතු වාහන සඳහා ඉන්ධන ඇණවුම් මත ඉන්ධන ලබා ගෙන ඒ සඳහා එකතුව රු.334,660 ක් වැය කර තිබුණු අතර, මෙම වියදම ඉන්ධන සඳහා වන නිවැරදි වැය විෂයේ ගිණුම්ගත නොකර එය ප්‍රජාව තුළ සිටින අසරණ කණ්ඩායම් සවිබල ගැන්වීමේ වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 3.3.3 බැරකම් අඩුවෙන් දැක්වීම

------------------------------

2014 වර්ෂයට අදාළ රු.15,210,919 ක වියදමක් 2015 වර්ෂයේදී ගෙවා තිබුණත්, එම බැරකම විසර්ජන ගිණුමේ රු.11,909,783 ක් වශයෙන් දක්වා තිබීම නිසා රු.3,301,136 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ අඩුවෙන් සඳහන් කර තිබුණි.

## 3.4 අග්‍රිම ගිණුම.

----------------

අමාත්‍යාංශයේ පොත් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ උපඅග්‍රිම ශේෂය රු.253,986 ක් වුවත් විසර්ජන ගිණුමේ එය ශුන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි. භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.9,153,986 ක් වී තිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.963,624 ක්වූ තැන්පතු 37 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කෙරෙන මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර

විගණකාධිපති වෙත යැවිය යුතු වුවත්, අමාත්‍යාංශය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 12401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යනු ලබන පාලන ගිණුමේ ශේෂයෙහි වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.187,756 ක ගැලපීම් සටහනක් දක්වා තිබුණද, එය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වර්ෂ 13 කට අධික කාලයක සිට හිඟහිටව පැවත එන රු.41,530 ක් වූ ණය ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104(1) (3) (4) | | වාහන 08 කට සිදුවී ඇති හදිසි අනතුරු සම්බන්ධයෙන් අදාල පරීක්ෂණ පවත්වා ප්‍රාරම්භක වාර්තා හා පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක ජ.ලේ/1/17/1 දරන චක්‍රලේඛයේ 5.5 ඡේදය. | 93,927 | අමාත්‍යවරුන්ගේ ජංගම දුරකථන වෙනුවෙන් මාසික උපරිම වියදම් සීමාව රු.10,000 වුවත්, 2014 අප්‍රේල් මාසයේදී දුරකථන වියදම ලෙස රු.93,927 ක් ගෙවා තිබුණි. |
| **(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| 3.6 මාර්ගෝපදේශය | 2,653,950 | ලංසු කැඳවීමකින් තොරව ඇස් කණ්ණාඩි 17,643 ක් 2014 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. |

3.8 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් රු.210,208,325 ක් අමාත්‍යාංශය වෙත ලැබී තිබුණ අතර එම මුදලින් සියයට 67 ක් හෙවත් රු.140,160,000 ක් ආබාධිතයන්ට මුලාධාර ලබා දීම සඳහාද සියයට 5 ක් හෙවත් රු.10,819,680 වෘත්තීය පුහුණුව ලබා දීම වෙනුවෙන් ද වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) මුලාධාර ගිණුම්

මුලාධාර ගිණුමේ වූ ගනුදෙනු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී අදාල ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට (ගිණුම් අංක වැරදීම, අනුමත නොවූ අංක ලබාදීම හා වෙනත් හේතුන් මත) බැර නොවී ආපසු අමාත්‍යාංශය වෙත රු.2,901,000 ක් හරවා එවා තිබුණි.

(ii) නියැදි විගණන පරීක්ෂණයකට අනුව ආධාරලාභීන් 05 ගේ ගිණුම්වලට මාසිකව බැර කිරීමට යවන ලද මුදල් මාස කිහිපයකදි එක දිගටම නැවත අමාත්‍යාංශය වෙත ආපසු හරවා එවා තිබු අතර, ඒ ගිණුම් සම්බන්ධව හඳුනා ගැනීම් කටයුතු හා ඊට අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ආ) ආබාධිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම.**

**--------------------------------------------------------**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 නොවැම්බර් 30 දින ලෝක බැංකුව හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගත් ගිවිසුම් ප්‍රකාරව 2013 වර්ෂයේ සිට වෘත්තීය පුහුණු කටයුතු ආරම්භ කළ යුතු වුවත්, ආබාධිතයන්ට වෘත්තීය පුහුණු කටයුතු ප්‍රමාද කර 2014 ජුනි මාසයේදී ආරම්භ කර තිබුණි.

(ii) 2013 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් දක්වා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අමාත්‍යාංශය වැය කළ මුළු මුදල රු.228,193,680 ක් වූ අතර , එම මුදලින් රු.10,819,680 ක් හෙවත් සියයට 4.7 ක් පමණක් ආබාධිත පුද්ගලයන්ගේ වෘත්තීය පුහුණුව වෙනුවෙන් වැය කර තිබුණි.

(iii) ආයතනය සමඟ ඇතිකරගත් ගිවිසුම්වල කොන්දේසි අංක 03 (D) ඇමුණුම් A සඳහන් පරිදි එම ආයතනයන් හි මාසික ප්‍රගතිය හා වියදම් වාර්තා අමාත්‍යාංශය වෙත එවිය යුතු වුවත්, ආයතන 06 ක් විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එසේ කටයුතු කර නොතිබුණි.

3.9 කාර්යසාධනය

-----------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම් (අරමුණින් බැහැරවීම් යනාදිය)

--------------------------------------------------------------------------------

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අතර එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) හිටපු ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය වෙනුවෙන් පෞද්ගලික මාධ්‍ය ආයතනයක් විසින් පළ කළ අමාත්‍යාංශ දැන්වීම වෙනුවෙන් රු.130,637 ක් වැය කර තිබුණු අතර එම වියදම 124-2-5-1-1501 (2) දරන ප්‍රජාව තුළ සිටින අසරණ කණ්ඩායම් සවිබල ගැන්වීම වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ii) ළමා මධ්‍යස්ථාන වෙත බෙදාදීම සඳහා "ඇනී ලෝරි" පරිවර්තන පොත් 100 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.25,000 ක් වැය කර තිබුණි. 2015 ජුනි 23 දින විගණන අවස්ථාව වන විටත් එම පොත් බෙදා හැරිමට කටයුතු නොකර ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් වෙනුවෙන් ජල පිරිපහදු යන්ත්‍ර ලබාදීම සඳහා 2014 දෙසැම්බර් 30 දින මාරු පත්‍ර අංක 155 මඟින් රු.1,000,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණද අදාල කාර්ය නිමකර නොතිබුණි.

**(ii)** උපදේශන අංශය සතු ප්‍රධාන කාර්යයන් වන උපදේශන සේවා සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරිමේ කටයුතු, උපදේශන සේවා සම්බන්ධව ප්‍රමිතීන් සකස් කිරීම හා ප්‍රාදේශිය ලේකම් මට්ටමින් උපදේශන සේවා මධ්‍යස්ථාන ඉදිකිරිම් කටයුතු යනාදිය 2014 වර්ෂයේදී සිදුකර නොතිබුණි.

**(iii)** උපදේශන අංශය සඳහා රු.12,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, සමාලෝචිත වර්ෂ අවසාන වන විට ඉන් සියයට 12 ක් හෙවත් රු.1,409,189 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරිව් තිබුණි. අදාල ප්‍රාදේශිය වැඩසටහන් වසර තුළදී නිසියාකාරයෙන් සිදුවි නොමැති බව හා ඒ පිළිබඳ පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) ප්‍රගති වාර්තාවලින් සත්‍ය කාර්යසාධන මට්ටම අනාවරණය නොකිරීම.

-------------------------------------------------------------------------------

උපදේශනයට අදාල පත්‍රිකා හා සඟරා මුද්‍රණය කිරීමට රු.741,417 ක් වැය කර තිබුණු අතර ප්‍රගති වාර්තාවල එම වියදම රු.689,000 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව රු.52,417 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) සැලැසුම් කිරීමේ දුර්වලතා.

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරි සැලැස්ම අනුව පවුල් 500 කට තනි මාපිය ක්‍රමය යටතේ ස්වයං රැකියා ආධාර ලබා දීමට රු.6,000,000 ක ප්‍රතිපාදන සළසා තිබු අතර 2014 වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව රු.6,563,000 ක් උපයෝජනය කර පවුල් 588 කට ස්වයං රැකියා ආධාර ලබාදි තිබිණි. මේ අනුව විධිමත්ව සැලැසුම් කිරීමක් නොකර සළසා තිබුණු ප්‍රතිපාදනය රු.563,000 කින් ඉක්මවා ඉලක්කගත සංඛ්‍යාවට වඩා පවුල් 88 කට ස්වයං රැකියා ආධාර ලබාදි තිබුණි.

නුවරඑළිය, මාතලේ, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, හම්බන්තොට හා වවුනියා යන දිස්ත්‍රික්ක සඳහා මෙම ආධාර බෙදා දී නොතිබුණු අතර ඇතැම් දිස්ත්‍රික්කවල ප්‍රතිලාභින් වැඩිපුර සංඛ්‍යාවකට ආධාර ලබා දී තිබුණද, ඇතැම් දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් අඩු සංඛ්‍යාවකට ආධාර ලබා දී තිබුණි.

(ii) තනි මාපිය ආධාර වැඩසටහන යටතේ කුඩා කණ්ඩායම් සඳහා ස්වයං රැකියා වෙනුවෙන් ලබා දුන් ආධාර දිස්ත්‍රික්ක 25 න් මුලතිව් හා කළුතර දිස්ත්‍රික්කවලට පමණක් සීමාවී තිබුණි.

(ඉ) සැලැසුම් කළ පරිදි අපේක්ෂිත කාර්යසාධන මට්ටමකට ළඟා නොවීම

-----------------------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ස්වයංරැකියා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2014 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව තනි මාපිය 40 දෙනෙකුගේ පවුල්වල සාමාජිකයන් 70 දෙනෙකු සඳහා කුඩා කණ්ඩායම් ස්වයං රැකියා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට රු.900,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.360,000 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 40 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

(ii) කුඩා කණ්ඩායම් (තනි මාපිය) ස්වයං රැකියා ආධාර ලබාදිමට සාමාජිකයන් 40 දෙනෙකුට ඉලක්ක කර තිබුණද, සමාජිකයන් 26 දෙනෙකුට පමණක් ආධාර ලබා දි තිබුණි. එබැවින් එහි භෞතික ප්‍රගතිය සියයට 65 ක් වී තිබුණි.

(iii) පසුගිය වසරේ දිස්ත්‍රික්ක 08 ක රු.630,000 ක් වැය කර ස්වයං රැකියා සංවර්ධන වැඩසටහන් 10 ක් පවත්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු.360,000 ක් වියදම් කර දිස්ත්‍රික්ක 02 ක වැඩසටහන් 03 ක් පමණක් පවත්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී ස්වයං රැකියා පුහුණු වැඩසටහන් 10 ක් පැවැත්වීමට රු.100,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණු අතර ඉන් රු.77,316 ක් වියදම් කර පුහුණු වැඩසටහන් 05 ක් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව එහි මූල්‍ය ප්‍රගතිය සියයට 77 ක් වී තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 50 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පුද්ගලයන් 588 දෙනෙකුට රු.6,922,000 ක ස්වයං රැකියා ආධාර ලබා දී තිබුණත්, එහි ප්‍රගතිය පිළිබඳ වාර්තා අදාළ අංශය වෙත එවා නොතිබුණි.

(v) ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් 13 ක් සඳහා රු.2,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.1,527,000 ක් වියදම් කර වැඩසටහන් 09 ක් ඉටු කර තිබුණි. මේ අනුව ඉලක්කගත සංඛ්‍යාවට වඩා වැඩසටහන් 04 ක් අඩුවෙන් ක්‍රියාත්මක කර තිබුණි. මේ අනුව එහි මූල්‍ය ප්‍රගතිය සියයට 76 ක් වී තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 69 ක් වී තිබුණි.

(vi) ප්‍රගති වාර්තා අනුව ප්‍රකාශන කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,500,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර අත්පත්‍රිකා 35000 ක් මුද්‍රණයට හා උපදේශන සඟරා පිටපත් 1500 ක් මුද්‍රණය කිරීමට රු.689,000 ක් වියදම් කර තිබුණි. මේ අනුව මෙහි මූල්‍ය ප්‍රගතිය සියයට 46 ක් වී තිබුණි.

(vii) 2014 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව රු.5,040,000 ක ප්‍රතිපාදන සළසා ගෙන දැනුවත් කිරිමේ උපදේශන වැඩසටහන් 475 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපදේශන වැඩ සටහන් 413 ක් පවත්වා රු.3,596,000 ක් වැය කර තිබුණි. ඒ අනුව එහි මූල්‍ය ප්‍රගතිය සියයට 71 ක් වි තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 87 ක් වී තිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

---------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරික්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) සමාජ සත්කාර වැඩමුළුව සඳහා සහභාගි වීම සඳහා නිලධාරීන් තුන්දෙනෙකු විසින් රු.168,250 ක අත්තිකාරම් ලබාගෙන තිබුණු නමුත් එම නිලධාරින් අදාල වැඩසටහන්වලට සහභාගි වී නොතිබුණ අතර එම මුදල් වෙනත් නිලධාරීන් වෙත අවිධිමත් ලෙස පවරා තිබුණි.

(ආ) Voice ව්‍යාපෘතියේ කාර්යය සඳහා දේශිය අරමුදල් අපේක්ෂා කර නොතිබුණු අතර එම ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරිම සඳහා 2014 ජුනි 07 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. නමුත් එම ව්‍යාපෘතිය සඳහා වූ දුරකථන දෙකක් වෙනුවෙන් පිළිවෙලින් රු.65,723 ක් හා රු.30,065 ක් වශයෙන් එකතුව රු.95,788 ක් අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් ගෙවා තිබුණි.

(ඇ) 2014 ඔක්තෝබර් 15 දින ජාතික උපදේශන සේවා දිනය වෙනුවෙන් උපදේශන සඟරාවෙන් පිටපත් 1500 ක් මුද්‍රණය කර තිබුණි. ලංසු කැඳවීමකින් තොරව දුරකථනය මඟින් විමසිම කර රු.509,796 ක් වැය කර සඟරාවේ පිටපත් මුද්‍රණය කර ගෙන තිබුණි.

වර්ෂය ආරම්භයේ පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්ම මගින් මේ සඳහා ප්‍රතිපාදන සළසා තිබුණත්, වර්ෂය ආරම්භවී මාස 10 ක් ගත වි තිබුණත්, මේ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරිමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**3.11 මතභේදයට තුඩුදෙන ගැටළු**

--------------------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ගම්පහ දිස්ත්‍රික්කයේ තෝරාගත් ආබාධිත පුද්ගලයන් 845 කට රු.3,000 ක් බැගින් රු.2,535,000 ක් ගෙවිය යුතුව තිබුණත්, 2014 දෙසැම්බර් මාසයේදී 124-2-2-1-1501 දරන වැය විෂයෙන් රු.9,352,347 ක අසාමාන්‍ය වියදමක් කර තිබුණි.

(ආ) හිටපු අමාත්‍යාංශ ලේකම් විසින් 2014 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ලබාගෙන තිබු ඉන්ධන දීමනාව රු.382,050 ක් වු අතර එම කාලයට අදාළව රු.754,505 ක අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි. මෙය ඉන්ධන දීමනාව මෙන් සියයට 197 ක් වී තිබුණි.

(ඇ) හිටපු විෂයභාර අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු විසින් ඇමතිතුමාගේ උපදෙස් පරිදි බව සඳහන් ඉල්ලීම් ඉදිරිපත් කරමින් රු.694,760 ක් වටිනා රෝද පුටු 54 ක් ලබාගෙන තිබුණු අතර එම රෝද පුටු විෂයභාර ඇමතිවරයාගේ නිවසේ පිහිටි කාර්යාලයට භාර දුන්බව ප්‍රකාශ කර තිබුණි. නමුත් මිලදී ගෙන තිබුණු රෝද පුටු අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් වෙත බෙදා දුන් බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා ඉදිරිපත් කරන ලද සුදුසුකම්ලත් අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන්ගේ ඉල්ලීම් නොසලකා මැති ඇමතිවරුන්ට, ජනාධිපති ලේකම් කාර්යාලයට සහ ජනාධිපති ආර්යාව වෙත එකතුව රු.2,050,400 ක් වටිනා රෝද පුටු 127 ක් නිකුත් කර තිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 04 දින පවත්වන ලද ජාත්‍යන්තර ආබාධිත දින උත්සවය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු.7,524,173 ක් වැය කර තිබුණි. එම වියදම තුළ ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් රු.1,018,625 ක්ද, ප්‍රවාහන වියදම් වෙනුවෙන් රු.1,374,530 ක් හා ත්‍යාග මිලදී ගැනිම වෙනුවෙන් රු.2,250,000 ක්ද එම වියදමෙහි ඇතුළත්ව තිබුණි. අමාත්‍යාංශය

විසින් මුලින් සැලැසුම් කළ පරිදි සහභාගිත්ව ආබාධිත ප්‍රජාව 1410 ක් ලෙස දක්වා තිබුණද, ඉදිරිපත් කරන ලද ආහාර බිල්පත අනුව එම ප්‍රමාණය 4000 ක් වී තිබුණි.

## 3.12 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

-----------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) **ආබාධිත පුද්ගලයන් සඳහා ආධාරක උපකරණ මිලදී ගැනීම හා ඒවා බෙදා දීම පිළිබඳව කරන ලද නියැදි පරීක්ෂණයේ දී** ඇස් කණ්නාඩි 6,493 ක් සඳහා රු.979,950 ක් ව්‍යාජ කරුණු පදනම් කර ගෙන මිලදී ගෙන තිබුණි.

(ආ) හිටපු සමාජ සේවා අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා වෙත භාරදුන් බවට ලේඛනවල සඳහන් වී තිබුණු රු.1,267,500 වටිනා දුර හා ලඟ පෙනෙන ඇස් කණ්නාඩි 1950 ක් ප්‍රතිලාභීන් වෙත බෙදා හැරි බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශාන්ත අන්තෝනි දේවස්ථානයේදී අක්ෂි සායනයක් පවත්වා ඇස් කණ්නාඩි බෙදා නොතිබුණත්, ඇස් කණ්නාඩි බෙදාදුන් බවට ව්‍යාජ පුද්ගල නාම ලේඛනයක් ඉදිරිපත් කර තිබුණි.

(ඈ) මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් සහභාගි වී නොතිබුණත්, මොනරාගල දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරිගේ අත්සන සහ මුද්‍රාව ව්‍යාජ ලෙස භාවිතා කර ජංගම සේවාවක් පැවැත්වූ බව සඳහන් කර රු.150,000 ක ගෙවීම් කර තිබුණි.

(ඉ) අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් විසින් ජා ඇල දික්කන්ද කටුවක්ගොඩ හා කැළණිය නාකියාදෙණිය යන ස්ථානවලදී ජංගම සේවාවන් පැවැත්වූ බවට ඉදිරිපත් කළ ලිපි ලේඛන මත රු.523,950 ක ගෙවීම් කර තිබුණි.

## 3.13 කළමනාකරණ දුර්වලතා

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ඇස් කණ්නාඩි බෙදාදීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් සහ යාන්ත්‍රණයක් තිබියදී එයට පටහැනිව බාහිර පුද්ගලයන්ගේ මැදිහත්වීමක් සිදුවී තිබුණ බැවින් අඩු ආදායම්ලාභී ආබාධිත තැනැත්තන්ට වෙන්කළ මුදල්වල ප්‍රතිලාභ ඔවුනට නොලැබී තිබුණු අතර වංචනික ලේඛන ඉදිරිපත් කර මුදල් ලබාගෙන තිබුණ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) ජංගම සායනවලදී බෙදාදිමට සැලැසුම් කර තිබුණු ඇස් කණ්නාඩි, සැපයුම්කරු විසින් අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදාහැර තිබුණි. එසේ බෙදාහැර තිබුණු ඇස් කණ්නාඩි නියමිත පිරිවිතරවලට අනුකූලව සැපයුම්කරු විසින් සපයා තිබුණු බවට අමාත්‍යාංශය විසින් තහවුරු කරගෙන ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම්වරු, සමාජ සේවා නිලධාරීන්, සමාජ සංවර්ධන නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන් මගින් අවශ්‍යතා ඇති අයගේ ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීමේ ක්‍රියාවලියක් තිබියදී එසේ කටයුතු නොකර දේශපාලන මැදිහත්වීම් මත අඩු ආදායම්ලාභි ආබාධිත පුද්ගලයන්ගේ අවශ්‍යතා ඉටු කිරිමේ වැඩසටහන් පවත්වා තිබුණි.

(ඈ) ඇස්කණ්නාඩි බෙදා දීමේ ජංගම සේවාවේදී ඇස් කණ්නාඩිලාභීන්ගේ ආදායම් තත්ත්වය පිළිබඳ සැළකිල්ලක් දක්වා නොතිබුණු බැවින් අඩු ආදායම්ලාභී පුද්ගලයන් හට ලබාදිය යුතු ආධාර වෙනත් පුද්ගලයන්ට ලබාදී තිබුණි.

(ඉ) පවතින නිර්නායක අනුව ඇස් කණ්ණාඩි ලබාදීමට සුදුසුකම වන්නේ මාසික ආදායම රු.6,000 කට වඩා අඩු ආදායම් ඇති දෘෂ්ටි හීනතාවයක් ඇති පුද්ගලයන්ටය. එවැනි පුද්ගලයන් පිළිබඳව සමීක්ෂණයක් සිදු නොකර ලඟ පෙනෙන ඇස් කණ්නාඩි 121,786 ක් මිලදී ගෙන තිබුණි. සමාජ සේවා නිලධාරීන් ජාලයක් සහ පරිපාලනමය යාන්ත්‍රණයක් තිබියදී එය නොසළකා හැර වියදම් කර තිබුණි.

## 3.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 11 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 424 | 252 | 172 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 60 | 53 | 07 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | **එකතුව** | **504** | **319** | **185** |

## 4. ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව

### 4.1 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් අනුමැතින්, ලේඛන, ලදුපත් හා තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(අ) වෘත්තීය පුහුණු ආයතන සඳහා ආබාධිත පුද්ගලයන් බඳවා ගැනීමේදී සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් නම් කරනු ලබන නිලධාරියෙකු සහභාගි විය යුතු බව 2011 සැපතැම්බර් 19 දිනැති අංක SS/4/1/1 – 1 දරන සමාජ සේවා අධ්‍යක්ෂකගේ ලිපියෙහි සඳහන්ව තිබුණි. නමුත් වෘත්තීය පුහුණු ආයතන සඳහා ආබාධිත පුද්ගලයන් බඳවා ගෙන තිබුණත්, ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද නිලධාරියෙකු සහභාගී වී නොතිබුණි. එසේම බඳවාගත් අභ්‍යාසලාභීන්ගේ තොරතුරු ඇතුළත් ලේඛනයක් අනුමැතිය සඳහා නොපමාව දෙපාර්තමේන්තුවට එවිය යුතු වුවත්, ආයතන 08 කින් බඳවා ගැනීම් සිදු කර තිබුණත්, ඒ සඳහා ලබා ගත් අනුමැතින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වෘත්තීය පුහුණු ආයතනයන් තුළ ඉගෙනුම ලබන ආබාධිත දරුවන්ගේ විස්තර ඇතුළත් නාම ලේඛනයන් දෙපාර්තමේන්තුවේ පවත්වා නොතිබුණි.

(ඇ) ස්වේච්ඡා වෘත්තිය පුහුණු ආයතන 07 ක අභ්‍යාසලාභීන් 138 ක් සඳහා අභ්‍යාසලාභී දීමනා රු.3,032,423 ක් ගෙවා තිබුණද, එම මුදල් අභ්‍යාසලාභින් වෙත ලැබූ බවට තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. එසේම ආයතන 07 කට යවන ලද රු.2,410,473 ක මුදල් සඳහා ලදුපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) ජාතික මානසික සෞඛ්‍ය සභාව වෙත පැමිණෙන සේවාලාභින්ට පැමිණීමේ දීමනා ගෙවීම සඳහා රු.376,400 ක් දෙපාර්තමේන්තුව විසින් යවා තිබුණත්, සේවාලාභින්ට එම දිමනා ලබාදුන් බවට ලිඛිත තහවුරුවක් ලැබී නොතිබුණි.

## 4.2 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

--------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11.96 ක සිට සියයට100 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවතිණි.

(ආ) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයන් 31 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය ඉක්මවා රු.6,249,662 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඇ) විසර්ජන ගිණුමෙහි සඳහන් වැය විෂයන් 3 ක බැරකම් වටිනාකම් හා බැරකම් ලේඛනයේ සඳහන් වටිනාකම් අතර රු.11,234 ක වෙනසක් විය.

## 4.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

විෂය අංක 21601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන් 13 දෙනෙකුගේ රු.1,398,844 ක ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 හා 4.4 වගන්ති ප්‍රකාර අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් වර්ෂ එකක සිට වර්ෂ 13 ක කාල පරාසයක සිට පැවැත එන අයවිය යුතු එකතුව රු.311,477 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැඩ තහනම් කළ නිලධාරිගෙන් 2014 දෙසැම්බර් 31 දින වන විට වසර 4 ක සිට වසර 19 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණු එකතුව රු.293,550 ක ණය ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් ආයතනවලට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් අනාවරණය කර තිබුණු භාණ්ඩ වර්ග 271 ක ඌනතා හා භාණ්ඩ වර්ග 124 ක අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 371 | 55,360 | කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත්, කාර්යය නිමවී දින 14 ක |

| | | | |
|---|---|---|---|
| | | | සිට දින 35 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව ලබා ගෙන තිබුණු අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 104(1) (3) හා (4) | - | සමාලෝචිත වර්ෂයේදී සිදුවූ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් 2015 ජුනි 25 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

**-------------------------**

| | | |
|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛයේ 03 ඡේදය. | 255,400 | පරිගණක, උපාංග හා මෘදුකාංග මිලදී ගැනීමේදී චක්‍රලේඛයේ සඳහන් ආකෘති සම්පූර්ණ නොකර ගෙවීම් කර තිබුණි. |

4.6 කාර්යසාධනය

-----------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

**-------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ආබාධිත තරුණ තරුණියන් 700 කට පුහුණුව ලබා දිමට සැලැසුම් කර තිබුණද, 633 දෙනෙකුට පමණක් පුහුණුව ලබා දී තිබුණි.

(ii) පුහුණුව අවසන් කළ අභ්‍යාසලාභින් 145 දෙනෙකුට මෙවලම් උපකරණ ලබා දිමට සැලැසුම් කර තිබුණද, 103 දෙනෙකුට පමණක් මෙවලම් උපකරණ ලබා දී තිබුණි.

(iii) රාජ්‍ය නොවන ආයතන 09 කට මුල්‍ය ආධාර සැපයීමට සැලැසුම් කර තිබුණද මුල්‍ය ආධාර රාජ්‍ය ආයතන 06 කට ලබා දි තිබුණි.

**(iv)** විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා රත්නපුර නගරයේ පිහිටුවා තිබූ මධ්‍යස්ථානයට ක්‍රියාකාරි සැලැස්ම අනුව රු.4,200,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණත්, ඉන් රු.447,000 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 11 උපයෝජනය කර තිබුණි.

**(v)** ස්වේච්ඡා සේවකයින් පුහුණු කිරීමේ වැඩසටහන් 331 ක් හා සංඥා භාෂා පුහුණු වැඩසටහන් 25 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණත්, පිළිවෙලින් වැඩසටහන් 231 ක් හා 11 ක් පමණක් පවත්වා තිබුණි.

**(vi)** ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන තුළින් ඍජු ප්‍රතිලාභ වශයෙන් කොමඩ්, විදුලිය, රැම්ස් ආදි උපකරණ 125 ක් ලබා දීමට ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර තිබුණත්, එම උපකරණවලින් 117 ක් බෙදා දී තිබුණි. දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 9 කට කිසිදු උපකරණයක් නිකුත් කර නොතිබුණි. කළුතර දිස්ත්‍රික්කයට උපකරණ 28 ක් නිකුත් කර තිබුණු අතර එය උපරිම වශයෙන් උපකරණ නිකුත් කළ දිස්ත්‍රික්කය විය. දිස්ත්‍රික්ක 16 ක මෙම උපකරණ බෙදා දී තිබුණද, දිස්ත්‍රික්ක අතර උපකරණ බෙදා දිමේ සමානතාවයක් නොතිබුණි.

**(vii)** ප්‍රජා මූලික පුනරුත්ථාපන ව්‍යාපෘතියේ අත් පොත මුද්‍රණයට හා අනෙකුත් මුද්‍රණ කටයුතු සඳහා රු.200,000 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර ප්‍රගති වාර්තා අනුව එම කටයුතු සඳහා රු.168,000 ක් වැය කර තිබුණද ව්‍යාපෘති අත් පොත මුද්‍රණය කර නොතිබුණි.

**(viii)** දිස්ත්‍රික්ක හා ප්‍රාදේශිය ලේකම් මට්ටමින් ඇගයිම් වැඩසටහන් 25 ක් ක්‍රියාත්මක කිරිම සඳහා රු.500,000 ක වැය කිරිමට සැලැසුම් කර තිබුණද, වාර්ෂික ප්‍රගති වාර්තා අනුව ඉන් රු.430,000 ක් වියදම් කර වැඩසටහන් 12 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එහි මූල්‍ය ප්‍රගතිය සියයට 86 ක් වන අතර භෞතික ප්‍රගතිය සියයට 48 ක් වී තිබුණි.

**(ix)** පුවක්පිටියේ ජයවිරු සෙවන ආයතනයේ දෙමාපියන් හා භාරකරුවන් අහිමි මන්ද මානසික පිරිමි ළමුන් 50 දෙනෙකුට රැකවරණය හා නේවාසික පහසුකම් සැපයිය හැකි වුවත්, 2014 වර්ෂයේදී ළමුන් 47 දෙනෙකුට සේවය සපයා තිබුණි. 2014 වර්ෂයේදී ළමුන් 100 දෙනෙකුට නේවාසික පහසුකම් ලබා දීමට හැකි වන පරිදි ගොඩනැඟිලි ඉදිකිරිම ආරම්භ කිරිම වෙනුවෙන් එහි පළමු අදියර සඳහා රුපියල් මිලියන 7 ක් ලබා දී තිබුණි. 2014 වර්ෂය සඳහා වූ ඉදිකිරිම් කටයුතු 2014 ඔක්තෝබර් මාසයේදී ආරම්භ කර තිබුණි.

**(x)** ළමයින්ගේ වර්ධනයේ කිසියම් ගැටළුවක් හෝ ප්‍රමාදයක් ඇති බවට සැකසහිත අවස්ථාවකදි හෝ ආබාධයක් ඇති බවට හඳුනාගත් පසුව යොමු කරන ස්ථානය වූ ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන මඟින් 2014 වර්ෂයේදී සැලැසුම් කළ පහත සඳහන් කාර්යයන් වසර තුළ ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

- ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීම හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන ආරම්භ කිරීම පිළිබඳ දිස්ත්‍රික්ක සමාජ සේවා නිලධාරින්ගේ වැඩමුළුව.
- ළමා මාර්ගෝපදේශන ව්‍යාපෘතිය පිළිබඳව මොණරාගල දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන.
- විශේෂ අවශ්‍යතා සහිත ළමුන් පිළිබඳව පෙර පාසල් ගුරුවරුන් සංවේදි කිරීම හා අන්තර් කරන අවස්ථා පුළුල් කිරීම සඳහා වන දෙදින වැඩමුලු 02 ක් පැවැත්වීම (මොණරාගල දිස්ත්‍රික්කය)
- බස්නාහිර පළාත් සමාජ සේවා නිලධාරින්, සමාජ සංවර්ධන සහකාර නිලධාරින් හා ළමුන් සම්බන්ධ නිලධාරින් දැනුවත් කිරීම හා විධිමත් පාසල්වලට ඇතුළත් කිරීමට යෝජිත ළමුන්ගේ දෙමාපියන් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරින් හමුව (බස්නාහිර පළාත)
- ළමා මාර්ගෝපදේශන ව්‍යාපෘතිය පිළිබඳව පොළොන්නරුව දිස්ත්‍රික් නිලධාරින් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන
- විශේෂ අවශ්‍යතා සහිත ළමුන් පිළිබඳව සංවේදි කිරීමේ හා අන්තර් කරන අවස්ථා පුළුල් කිරීම සඳහා පෙර පාසල් ගුරු පුහුණු දෙදින වැඩ මුළුව (අම්පාර දිස්ත්‍රික්කය)
- විශේෂ අවශ්‍යතා සහිත ළමුන් පිළිබඳව සංවේදී කිරීමේ හා අන්තර් කරන අවස්ථා පුළුල් කිරීම සඳහා පෙර පාසල් ගුරු පුහුණු දෙදින වැඩමුලුව (මහනුවර දිස්ත්‍රික්කය)

4.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු
----------------------------------------

වෘත්තීය පුහුණු ආයතනවලින් සෘජුවම බැංකුවට ලද රු.37,462 ක ලැබීම් ආදායමට ගෙන නොතිබුණි.

4.8 අධිකාරි බලය නොමැති ගනුදෙනු.

-------------------------------------

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේදී ස්වේච්ඡා ආයතන සඳහා නඩත්තු වියදම් ලෙස රු.1,352,680 ක් ගෙවා තිබුණද ඒ සඳහා විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.9 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

---------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 09 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 164 | 125 | 39 |
| (iii) | ද්විතියික මට්ටම | 493 | 439 | 54 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 97 | 85 | 12 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 18 | 09 | 09 |
| | එකතුව | 783 | 667 | 116 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 09 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) සමාජ සේවා අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා නිලධාරීන් 04 දෙනෙකු යොදවා තිබුණි.